අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2018

පෙරහුරු පරීක්ෂණය

50 - නාට්‍යය හා රංග කලාව I, II

(නව නිර්දේශය) පැය

සැලකිය යුතුයි

I. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

III. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

IV. එම උත්තර පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

පහත දැක්වෙන ගීත කොටස් ඇසුරින් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවට පිළිතුරු සපයන්න.

A. අපට පුතේ මගක් නැතේ
මේ මග මිස යමන් පුතේ
දෙවියො බලයි මුහුණ ඔබේ
නුඹව රකියි යමන් පුතේ

B. හඳ පායන කල ගඟබඩ ඉඳගෙන
ඔබෙ හිස පීරන්නම්
මල් පෙති විසිරුණු සුදුවැලි මතුපිට
ඔබ ගෙන ඇවිදින්නම්

C. අඹ දඹ නාරං - කෙසෙල් දෙල්
පනා කකා මේ - වනා සැපා ලබනෙම්

D. දුලා නෙතු පුලා - දිසි ස්වර්ණලතා සේ මෙ ළඳා
ලත් හිරු රැස් ලෙස පද්ම විකසිත
සිත් මාගේ පත් වේය තෘප්ත විලසට

E. රාජ සම්පත් නොමින් - දේය රාජා උතුම්

කුමරාගෙ පිනක් මැයි - වාසනා බෝ වාසනා බො

1. දේශීය නාට්‍ය කලාව නව මගකට යොමු කරමින් 1956 වර්ෂයේ නිර්මිත නාට්‍යයකට අයත් ගීතය වන්නේ,

   (1) A (2) B (3) C (4) D

2. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් ගීත වන්නේ,

   (1) AB (2) BC (3) CE (4) BD

3. 1961 වර්ෂයේ නිර්මාණය කරන ලද පර්යේෂණාත්මක නාට්‍යයකට අයත් ගීතය වන්නේ,

   (1) A (2) B (3) C (4) D

4. කාන්තාවක විසින් සෙබළ පිරිසකට විරෝධය දක්වමින් ගයන සංවාදයකි.

   (1) A (2) B (3) C (4) D

❖ නිවැරදි වරණය තෝරන්න.

5. අනෙකුත් ප්‍රාසාංගික කලාවන් අතර නාට්‍ය කලාව සුවිශේෂී වන්නේ,
   1. සජීවී කලාවක් වන බැවිනි
   2. ශිල්පීය පෞරුෂය මතුකර දක්වන බැවිනි.
   3. නිශ්චිත ස්ථානයක ඉදිරිපත් කෙරෙන බැවිනි.
   4. අනෙකුත් කලාවන් මත යැපෙන පරායත්ත කලාවක් වන බැවිනි.

6. දෙපානෝ, හංසවිල, නළ දමයන්ති, මානසවිල යන ප්‍රාසාංගික කලා අයත් වන ප්‍රභේද පිළිවෙලින්,
   1. ගීත නාට්‍ය, බැලේ නාට්‍ය, මුද්‍රා නාට්‍ය, ඔපෙරා
   2. බැලේ නාට්‍ය, ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය, ඔපෙරා
   3. ගීත නාට්‍ය, වේදිකා නාට්‍ය, මුද්‍රා නාට්‍ය, බැලේ නාට්‍ය
   4. ඔපෙරා, මුද්‍රා නාට්‍ය, ගීත නාට්‍ය, බැලේ.

7. කතන්දරය හා නාට්‍යය සම්බන්ධව ගැලපෙන ප්‍රකාශය වන්නේ,
   1. කතන්දරය හා නාට්‍යයක කතා පුවත දීර්ඝකාලීනව විකාශය වේ.
   2. කතන්දරයක හා නාට්‍යයක චරිත ඇතුළත් වේ.
   3. කතන්දරය හා නාට්‍යය අසා රසා විඳීමට තිබෙන්නකි.

4. කතන්දරයක හා නාට්‍යයක යටිපෙළක් ද දැකිය හැකිය.

8. වේදිකා නාට්‍ය කලාවෙහි හා ටෙලිනාට්‍ය කලාවෙහි දක්නට ලැබෙන ලක්ෂණ අතර සාමාන්‍යතාවක් වන්නේ,
   1. සජීවී ගුණයෙන් යුක්ත වීමයි.
   2. එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය වීමයි.
   3. නැවත නැවතත් නිර්මාණය වෙනස් කළ හැකි වීමයි
   4. පෙළ රචනයක් මත නිර්මාණය වීමයි

9. සංවාද භාවිතයේදී වැදගත් නොවේ.

   (1) භාව ප්‍රකාශනය
   (2) තේමාවේ සංකීර්ණ බව
   (3) චරිතය හා ගැළපීම
   (4) නිරවුල් හා පැහැදිලි හඬ

❖ අංක 10 සිට 14 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන වරණය තෝරන්න.

10. නාට්‍යමය අවස්ථාවක සුවිශේෂී ලක්ෂණ වේ.
   1. චරිත කිහිපයක් ඇතුළත් වේ.
   2. ගැටුම් අවස්ථාවක් තිබීම.
   3. කුතුහලය දනවන සුළුවීම.
   4. චරිත ප්‍රශ්නයකට මුහුණදීම.

11. නාට්‍ය පෙළක දක්නට ලැබෙන ලක්ෂණයකි
   1. යටි පෙළින් මතුවන ජීවන ප්‍රාඥප්තියක් අන්තර්ගත වීම.
   2. රංග පරම බවින් තොරව පෙළ රචනා වී තිබීම.
   3. රංග විධාන, චරිත හා සංවාද ඇතුළත්ව තිබීම.
   4. මුල, මැද, අග සහිත තර්කානුකුල සිද්ධි පෙළ ගැස්වීම.

12. විකෘති නාට්‍ය පෙළ තුළින් මතුවන තේමාවන් වේ,
   1. 80 දශකයේ සමාජයත්, පවුලත් අතර සිදුවන්නා වූ වෙනස්කම්වල හරස්කඩක් ඉදිරිපත් කරයි.
   2. දෙමව්පියන්ගේ වැරදි කළමනාකරණ හා තීරණ දරුවන්ගේ ජීවිත උඩු යටිකුරු කරන ආකාරය හුවා දක්වයි.
   3. විවෘත ආර්ථිකයත් සමග සිදු වූ යහපත් අධ්‍යාපනික ප්‍රවණතා එළි දක්වයි.

4. තරගකාරී අධ්‍යාපනය හමුවේ බිඳ වැටෙන යෞවනයේ ඛේදවාචකය මතු කර දක්වයි.


13. නාට්‍යයක පසුතලයක් නිර්මාණය කිරීමේදී ප්‍රායෝගිකව භාවිත කළ හැකි වන්නේ,

1. ඉහළට නැගීම සඳහා ඍජිෆෝම් යොදාගෙන පඩිපෙළක් නිර්මාණය කිරීමයි.
2. ගෝනි භාවිතයෙන් බිත්තියක් නිර්මාණය කිරීමයි.
3. රංගාලෝකය ඇසුරින් පසුතලය නිර්මාණය කිරීමයි.
4. නළු නිළියන් මගින් පසුතලය නිර්මාණය කිරීමයි.

14. අභිරූපණයක් ඉදිරිපත් කිරීමේදී

1. අභ්‍යන්තර හා බාහිර ශිල්පක්‍රම අනුගමනය කළ යුතුයි.
2. ආංගික, ආහාර්ය හා වාචික අභිනය භාවිත කළ යුතුය.
3. කාලය විනාඩි 5 - 10 අතර වීම වඩාත් යෝග්‍ය වේ.
4. රංගනය තාත්විකත්වය ඉක්මවූ අධිරංග ස්වභාවයක් ගත යුතුය.

❖ පහත දැක්වෙන දළ සටහන ඇසුරින් අංක 15 හා 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




15. ඉහත දැක්වෙන්නේ ප්‍රොසීනියම් රංග භූමියේ භූගෝලීය බෙදීමයි. ඒ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. මෙම කාල්පනික බෙදීම ප්‍රයෝජනවත් වන්නේ අධ්‍යක්ෂවරයාට පමණි.
2. රූපණ ශිල්පියාට ස්වකීය රංගය කළමනාකරණය කර ගැනීමට මෙම බෙදීම යොදාගත හැකිය.
3. ප්‍රොසීනියම් වේදිකාවේ මෙම බෙදීම මෙන්ම දෘෂ්ටි රේඛාවද මනඃකල්පිත වේ.
4. රංගාලෝක ශිල්පියා මෙම බෙදීමට අනුව ස්වකීය රංගාලෝක සැලසුම සකස් කරයි.

16. නාට්‍යයේ උපරිම අවස්ථාවක රංගය ඉදිරිපත් කිරීමට වඩාත් සුදුසු විය හැක්කේ,


(1) ABCE (2) EGHI (3) ADGH (4) CFIH

* පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් අංක 17 සිට 31 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



C



D



17. සෙක්කුව සහ චරන්දාස් යන නාට්‍ය අධ්‍යක්ෂණය කරන ලද අධ්‍යක්ෂවරයා වන්නේ,

(1) A (2) B (3) C (4) D

18. "B" හි දැක්වෙන නාට්‍යකරුවා විසින් නිර්මාණය කරන ලද නාට්‍ය දෙකකි.

(1) මහගිරි දඹ, අන්දරේලා (2) රජ දැක්ම, පිං පෙට්ටිය

(3) කපුටු බෝ, අහසින් වැටුණු මිනිස්සු (4) බෝඩිං කාරයෝ, තට්ටු ගෙවල්

19. "C" රූපයේ දැක්වෙන ශිල්පිණිය රංගනයෙන් දායක වූ නාට්‍ය දෙකකි.

(1) දෝන කතිරිනා, පුත්‍ර සාමාගම (2) කුවේණි, දිරිය මව හා ඇගේ දරුවෝ

(3) තාරාවෝ ඉගිලෙති, රතු හැට්ටකාරි (4) විකෘති, හිම කුමාරි

20. කුවේණි, ජනේලය යන නාට්‍යවල රංගනයෙන් දායක වූ ශිල්පියා වන්නේ,


(1) A (2) B (3) C (4) D

21. A රූපයට අයත් නාට්‍යකරුවා විසින් ආරම්භ කරන ලද ජංගම රඟමඬල වන්නේ,

(1) කරළිය (2) සබය (3) කැරකෙන වේදිකාව (4) ජන කරළිය

❖ පහත රූප සටහන් ඇසුරින් අංක 22, 23 හා 24 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



22. ඉහත A රංග භූමියේ රංග ශෛලිය පිළිබඳ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1. මෙහි හෙලේනා, සුලඹාවතී, රජතුන් කට්ටුව, යන නාට්‍ය රඟ දක්වා ඇත.
2. මෙහි පූර්ව රංගයේ එන චරිත ලෙස බහුබූතයා, සෙල්ලන් ළමා, අනාගත වක්තෘ දැක්විය හැක.
3. ආලෝකය සඳහා කිට්සන් පහන් හා පන්දම් ආලෝකය යොදාගෙන ඇත.
4. මෙහිදී උපයෝගී කර ගන්නා ලද්දේ උත්තර භාරතීය සංගීතයයි.

23. කපුයක්කාරිය, වඩිග එටුන, රාම මැරීම, අඹ විදමන ආදී නාට්‍යමය පෙළපාලි හා සම්බන්ධ වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

24. උඩරට ප්‍රධාන ගැමි නාටකය රඟ දක්වන ලද්දේ,

(1) D වලදීය (2) C වලදීය (3) B වලදීය (4) A වලදීය.

❖ පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 25 සිට 29 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල්කෘතියේ නම | රචකයාගේ නම | පරිවර්තනය/ අනුවර්තනය | පරිවර්තනය/ අනුවර්තනය |
|---|---|---|---|
| එව්රිමෑන් | ක | සකලජන | බන්දුල ජයවර්ධන |
| ග | ඇන්ටන් චෙකොව් | මගුල් ප්‍රස්තාව | යූ.ඒ. ගුණසේකර |
| ඩෝල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් | බෝනිකි ගෙදර | ජ |
| ට | ටෙනසි විලියම් | වෙස් මුහුණු | ධම්ම ජාගොඩ |
| ද ෆාදර් | ඔගස්ට් ස්ට්‍රින්බ(ර්)ග් | ඩ | ප්‍රේමරංජිත් තිලකරත්න |

25. ඉහත වගුවේ ''ක'' කොටුවට අයත් නාට්‍ය රචකයා වන්නේ,

(1) ටෙනසි විලියම්ස් ය. (2) බර්නාඩ් ෂෝ ය
(3) ඇන්ටන් චෙකොව් (4) හ්‍යුගෝ ෂෝන් හොෂ් මන්ස්තාල්ය

26. ඉහත වගුවේ ''ග'' කොටුවට අයත් නාට්‍ය වන්නේ,

(1) ඇපල් කා(ර්)ට් (2) ද ප්‍රොපෝසල්
(3) ද චෙරි ඕ(ර්)චා(ර්)ඩ් (4) ද මැරේජ්

27. වගුවේ ''ජ'' කොටුවට අයත් පරිවර්තක/ අනුවර්තක වන්නේ,

(1) සුනිල් විජේසිරිවර්ධන (2) ගුණසේන ගලප්පත්ති
(3) ධම්ම ජාගොඩ (4) බන්දුල විතානගේ

28. වගුවේ ''ට'' කොටුවට අයත් මුල් කෘතිය වනුයේ

(1) ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් (2) අ ස්ට්‍රීට් කා(ර්) චෝම්ඩ් ඩිසය(ර්)

(3) රුඩන්ස්                    (4) ද ෆාදු(ර්)

29. ඉහත වගුවේ ''ඩ'' කොටුවට අයත් නාට්‍ය වන්නේ,

(1) කඹය    (2) පුත්‍ර සමාගම    (3) මකරාක්ෂයා    (4) පී.....

❖ නිවැරදි වරණය තෝරන්න.

30. ''මංගර කුමරු මී කැඩීමට වනයට ගියවිට කුළුමීමකු මුණගැසී ඔහු හා සටන් වැද පැරදී මිය යයි.''

ඉහත සිදුවීම ඇතුළත් උපන් කතාව අයත් ශාන්තිකර්මය වන්නේ,

(1) කිරි මඩුව    (2) පහන් මඩුව    (3) පුනා මඩුව    (4) දෙවොල් මඩුව

31.





ඉහත රූපවලින් දැක්වෙන්නේ දහඅට සන්නියේ එන වෙස් මුහුණු දෙකකි. එම වෙස් මුහුණු දෙක වන්නේ,

(1) බිහිරි සන්නිය හා ගොළු සන්නිය වේ.    (2) අමුක්කු සන්නිය හා කණ සන්නිය වේ.

(3) දෙමළ සන්නිය හා දේව සන්නිය වේ.    (4) පිස්සු සන්නිය හා වෙඩි සන්නිය වේ.

32. ''ගුරුන්නාන්සේ මේක නිකම් කණ්ණාඩියක් නෙවෙයි, මේක අලි බලන කණ්ණාඩියක්. මේ කණ්ණාඩියෙන් මට තව දෙයක් පේනවා. සමහරු දරුවෝ එක්ක හිනා වෙනවා. සමහරු දරුවො නැතිව දුකෙන් ඉන්නවා.''

මෙම සංවාද ඛණ්ඩය ඇතුළත් ශාන්තිකර්මයට අදාළ නාට්‍යමය පෙළපාලියක් වනුයේ,

(1) දොළහ පෙළපාලිය යි    (2) මරා ඉපැද්දවීම යි

(3) ගබඩා කොල්ලය යි.    (4) පැදුරේ දැපවිල්ල යි.

33. ''ජටා හිස දරමින
ශුද්ධ අෂ්ටක වැල් ද කරල න
කුඩය ගෙන සුරතින
මෙසේ බමුණෙක් සබී නික්මුණ''

මෙම කවි ගායනය යොදන ශාන්තිකර්මයට අදාළ උපත් කතාවේ සඳහන් චරිත නාමයක් වේ.

(1) සේරමාන රජ (2) වසවර්ති කුමාරයා

(3) අසූපාල බිසව (4) විශ්මකර්ම දිව්‍ය පුත්‍රයා

34. වේදිකා නාට්‍යයක සංවාද සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. සෑම වේදිකා නාට්‍යයකම සංවාද ගද්‍ය, පද්‍ය හා ගීත ආකාරයෙන් විය යුතුය.
2. සංවාද ආශ්‍රයෙන් සතර අභිනයම ප්‍රකාශ විය යුයි.
3. සංවාද භාවිතයේදී වචන හැම විටම උස් හඬින් උච්ඡාරණය කළ යුතුයි.
4. සංවාද භාවිතයේදී චරිතයට අදාළ භාව ප්‍රකාශනය මැනවින් සිදුවිය යුතුයි.

35. කෙටි නාට්‍ය සංකල්පය හා වඩාත්ම ගැළපෙන ප්‍රකාශය වන්නේ,

1. සන්දර්භයේ අපූර්වත්වයක් තිබීමය.
2. ශිල්පක්‍රම හා භාෂාව මැනවින් භාවිත වීමය.
3. මිනිස් සිතේ ගැඹුරු ස්වභාවය හෙළි පෙහෙළි කිරීමය.
4. රංග කාලය හා සිදු වීමට ගතවන කාලය කෙටි වීමය.

36. ක්ෂණික නිරූපණ ක්‍රියාවලියේ දී සිදු නොවන්නේ,

1. කෙටි පිටපතක් සීමිත කාලයක් තුළ දී සතර අභිනයෙන් නිරූපණය කර දැක්වීමය.
2. හුදු අවස්ථා අනුකරණයට වඩා චරිත හා ගැටෙන නාට්‍යෝචිත අවස්ථාවන් ගොඩ නගා ගැනීමය.
3. අභිනය භාවිත කරමින් එම මොහොතේදීම සජීවීව රඟ දක්වා පෙන්වීමය.
4. අවස්ථා හා සිද්ධියට අදාළව පරිකල්පනා ශක්තිය මෙහෙයවා අවස්ථාව හා සිද්ධිය ගොඩ නැංවීමය.

37. ''නළුවරණය'' යනුවෙන් අදහස් කරන්නේ,

1. නාට්‍ය පෙළට අදාළව නළු නිළියන් හා ආනුෂාංගික ශිල්පීන් තෝරා ගැනීමයි.
2. නාට්‍ය පෙළෙහි චරිතවලට ගැළපෙන ලෙස නළු නිළියන් තෝරා ගැනීමයි.
3. නාට්‍ය පෙළ පිළිබඳව අධ්‍යක්ෂවරයා විසින් නළු නිළියන්ට කරනු ලබන පළමු පැහැදිලි කිරීමයි.
4. නාට්‍ය පෙළක ඇති විවිධාකාර චරිත අධ්‍යයනය කිරීමයි.

38. පහත තොරතුරු ඇසුරින් 38 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - ලී කෙළි D - කළගෙඩි නැටුම

B - නානු මුරය E - භරත නැටුම්

C - රාම සීතා

අංග වික්ෂේපන භාවිත කරන රිද්මයානුකූල හෝ තාලාන්විත නැටුම් අංග ප්‍රකාශ වන ඉංග්‍රීසි අක්ෂර කාණ්ඩය වන්නේ,

(1) B C D　　(2) A D E　　(3) A D F　　(4) B C E

❖ නිවැරදි වරණය තෝරන්න.

39. වේදිකා ආලෝකකරණයේදී සුදු වර්ණයට පමණක් ප්‍රතික්‍රියා දක්වන පහන් විශේෂය වන්නේ,

(1) ධාරාලෝක පහනයි　　(2) ස්ට්‍රෝබ් පහනයි.

(3) අල්ට්‍රා වයලට් පහනයි.　　(4) යොමු පහනයි.

40. ''පහත සඳහන් යෙදුම් අතරින් වේෂභූෂණ සම්බන්ධ නිවැරදි යෙදුම වන්නේ,

1. වේෂ භූෂණ මගින් විචිත්‍රවත් ප්‍රේක්ෂාවක් ජනනය විය යුතුයි.
2. වේෂ භූෂණ සඳහා දිළිසෙන රෙදි භාවිත කිරීමෙන් නාට්‍යය ආලෝකමත් වේ.
3. නාට්‍යයේ ශෛලිය අනුව වේෂ භූෂණ සැකසීම අත්‍යවශ්‍ය නොවේ.
4. වේෂ භූෂණ මගින් චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කළ හැකිය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

2018 පෙරහුරු පරීක්ෂණය

නාට්‍යය හා රංග කලාව - II

නව නිර්දේශය

**පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. දික්තල කාලගෝල නාට්‍යය සඳහා කතා පුවත උපුටා ගත් ග්‍රන්ථය හා ජාතක කතාව නම් කරන්න. (ලකුණු 02)

   ii. දික්තල කාලගෝල නාට්‍යය නාඩගම් සම්ප්‍රදායට අයත් බව සනාථ කිරීමට කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 02)

   iii. මෙම නාට්‍යයේදී සංගීතය සඳහා උපයෝගී කරගන්නා වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   iv. දික්තලා හා කාලගෝල චරිත නිරූපණය කළ රංගන ශිල්පියෙක් හා ශිල්පිනියක් නම් කරන්න. (ලකුණු 02)

   v. පහත දැක්වෙන චරිතවල ඥාති සම්බන්ධය දක්වන්න

      * දික් සුරඹී
      * කයිදා (ලකුණු 02)

   vi. දික්තල කාලගෝල නාට්‍යයෙන් මතු කෙරෙන ජීවිතාවබෝධය සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

2. ''නාට්‍යය පෙළ ප්‍රේක්ෂකයා වෙතට රැගෙන යන්නේ රූපණය තුළිනි.''

   i. රූපණය යනු කුමක්ද? (ලකුණු 02)

   ii. රූපණ ක්‍රියාවලියේ දී නළුවා උපයෝගී කරගන්නා ප්‍රධාන මාධ්‍යය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04)

   iii. එම මාධ්‍යය නාට්‍යයේ ශෛලිය අනුව වෙනස් වන අයුරු නිර්දිෂ්ට කෘති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

3. ''වේදිකා නාට්‍යයක, රංග වින්‍යාසය තුළින් ගොඩනැගෙන සෞන්දර්යාත්මක බව, ප්‍රේක්ෂක ආකර්ෂණයට හේතුවෙයි.''

   i. රංග වින්‍යාසය යනු කුමක්ද?

   (ලකුණු 02)

ii. රංග වින්‍යාසය නිර්මාණයේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් දක්වන්න.

(ලකුණු 04)

iii. ඔබ නැරඹූ නාට්‍යයක රංග වින්‍යාසය භාවිත කර තිබූ අයුරු සැකෙවින් දක්වන්න.

(ලකුණු 06)

4.

i. උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත දේව තොවිලයක් නම් කරන්න.

(ලකුණු 02)

ii. එම දේව තොවිලයේ ඇතුළත් අන්තර් රංග අවස්ථා හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. ඒ අතරින් එක් අන්තර් රංග අවස්ථාවක නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 06)

5. ''රංග කාර්යයේදී ආධුනිකයාට මෙන්ම ප්‍රවීණයාට ද රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.''

i. ඔබ කැමති රංග අභ්‍යාසයක් හා රංග ක්‍රීඩාවක් නම් කරන්න.

(ලකුණු 02)

ii. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩාවල යෙදීමෙන් රූපණ ශිල්පියාට ලබාගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න.

(ලකුණු 04)

iii. ඉහත (i) හි ඔබ සඳහන් කළ රංග ක්‍රීඩාව සිදුකළ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

6.






i. ඉහත දැක්වෙන චරිත අඩංගු ගැමිනාටකය නම් කරන්න.

(ලකුණු 02)

ii. එය රඟ දැක්වෙන රංග භූමියේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

(ලකුණු 04)

iii. මෙම රංගයේදී ප්‍රබලව සමාජ හා පුද්ගල දුබලතා හාස්‍යයට ලක් කරයි. ඒ බව සනාථ කරන්න.

(ලකුණු 06)

7. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකිය.

''බෝතල් පත්තර එකතු කිරීම ජීවිකාව කරගත් කරුණාපාලට හා ආරියපාලට දිනක් ලියවිල්ලක් ඇතුළට දමා තදින් මූඩිය වසා තිබූ බෝතලයක් හමුවෙයි. දවසේ වැඩ නිමවීමෙන් පසු ආරියපාල, කරුණාපාලට හොරෙන් බෝතලය රැගෙන පාළු ස්ථානයකට ගොස් විවෘත කරයි..... ''

i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

ii. සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08)